ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

දසවැනි පාර්ලිමේන්තුවේ

පළමුවැනි සභාවාරය

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 490**

# රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ

# හත්වැනි වාර්තාව

(කොළඹ මහා නගර සභාව සම්බන්ධයෙන් 2025.02.25, 2025.02.27 සහ 2025.10.08 යන දිනයන්හිදී සිදු කරන ලද විමර්ශන)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම් මහතා විසින්
2026 මාර්තු මස 06 වැනි දින ඉදිරිපත් කරන ලදී.

*2026 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.*

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) හි පහත පරිදි දක්වා ඇත:-

***"පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර ආමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ කළ නොහැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට අරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය හැකි ය."***

## දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය

1. ගරු කබීර් හෂීම් මහතා, පා.ම. - කාරක සභාවේ සභාපති
2. ගරු ඇන්ටන් ජයකොඩි මහතා, පා.ම.
3. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා, පා.ම.
4. ගරු සුගත් තිලකරත්න මහතා, පා.ම.
5. ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා, පා.ම.
6. ගරු නලින් හේවගේ මහතා, පා.ම.
7. ගරු අරවින්ද සෙනරත් මහතා, පා.ම.
8. ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා, පා.ම.,
9. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම.
10. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
11. ගරු ජේ.සී. අලවතුවල මහතා, පා.ම.
12. ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
13. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
14. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම.
15. ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා, පා.ම.
16. ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය, පා.ම.
17. ගරු මංජුල සුරවීර ආරච්චි මහතා, පා.ම.
18. ගරු කේ. ඉලංකුමාරන් මහතා, පා.ම.
19. ගරු ඔෂානි උමංගා මහත්මිය, පා.ම.
20. ගරු අජන්ත ගම්මැදගේ මහතා, පා.ම.
21. ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම.
22. ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම.
23. ගරු ටී.කේ. ජයසුන්දර මහතා, පා.ම.
24. ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා, පා.ම.
25. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා, පා.ම.
26. ගරු ලාල් ප්‍රේමනාත් මහතා, පා.ම.
27. ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.
28. ගරු සුනිල් රත්නසිරි මහතා, පා.ම.
29. ගරු චන්දන සූරියආරච්චි මහතා, පා.ම.
30. ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා, පා.ම.

## <u>කාරක සභා ලේකම් කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය</u>

- සනත් විජේගුණවර්ධන මයා - කාරක සභා ලේකම්/ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
- චමීලා රූපසිංහ මහත්මිය - ප්‍රධාන නිලධාරි
- ආර්. ඒ. ඩී. එන්. ගියෝවනී මහත්මිය - නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි
- ජේ. ටී. එල්. පී. සමීර මයා - සහකාර ප්‍රධාන නිලධාරි
- ජී. ඩී. ජේ. එච්. අයේෂ්මන්ති මෙය - පාර්ලිමේන්තු නිලධාරි
- ජී. එම්. කල්ලෑගොඩ මහත්මිය - පාර්ලිමේන්තු නිලධාරි
- එම්.එල්.ඒ.ඩී.එම්. කුමාරි මෙය - පාර්ලිමේන්තු නිලධාරි

## <u>කාරක සභා වාර්තා</u>

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කර ගැනීමට හැක.

Select language → Business of Parliament → Committees
→ Committee Reports → Select Legislature ($10^{th}$ Parliament)
→ Select Session ($1^{st}$ Session) → Select Committee Type
→ (Comittees for Special Purposes) → Select Committee
→ (Committee on Public Accounts) → Search

# <u>පටුන</u>

<u>පිටු අංකය</u>

A. සභාපතිවරයාගේ සටහන ........................................................... 1

B. සංක්ෂිප්ත වාර්තාව ........................................................... 3

C. විමර්ශනයේදී හඳුනාගත් ප්‍රධාන ගැටළු ආශ්‍රයෙන්,

a. සාකච්ඡා කරන ලද කරුණු

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

c. කාරක සභාවේ නිරීක්ෂණ

d. කාරක සභාවේ නිර්දේශ

e. නිර්දේශ ඉටුකිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ........................................................... 4

## <u>සභාපතිවරයාගේ සටහන</u>

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2025.02.25, 2025.02.27 සහ 2025.10.08 යන දිනවලදී කොළඹ මහා නගර සභාව සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන ඇතුළත් කාරක සභාවේ හත්වැනි වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (3) හි විධිවිධාන ප්‍රකාරව මම අද දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවෙන්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත පවරා ඇති රාජ්‍ය මූල්‍ය පාලන බලතල හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මගින් සලසා ඇති බලතල අනුව, මූල්‍ය අධීක්ෂණ කාරක සභාවක් වශයෙන් කටයුතු කරනු ලබන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජන කිරීම පෙන්නුම් කරන ගිණුම් ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම, මෙම කාරක සභාවේ මූලික කර්තව්‍ය වේ.

එම කර්තව්‍ය ඉටු කිරීමේදී විගණනය නමැති පශ්චාත් ක්‍රියාවලියෙන් කාරක සභාවට ලැබෙන දායකත්වය ඉමහත් වේ. නිවැරදි විගණනයක් තුළින් හඳුනාගත් දුර්වලතාවලට විසඳුම් ලබා දෙන අතරම, අකාර්යක්ෂමතාවයන් සක්‍රීයව වැළැක්වීම සඳහා අනාගතයේදී අතීත අඩුපාඩු වළක්වා ගැනීමට ආයතනවලට මඟ පෙන්වීමක් ද එතුළින් සිදුවේ.

මෙලෙස තෝරා ගත් මෙම ආයතනය සම්බන්ධයෙන් පමණක් වාර්තාවක් කඩිනමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හේතු වූයේ, කොළඹ මහා නගර සභාව සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී ලබා දුන් ඉතා පැහැදිලි විගණන නිර්දේශයන් සම්බන්ධයෙන් ද, ආයතනය විසින් මේ දක්වා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති වීම ඉතා බරපතල කරුණක් ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සැලකීමත්, ඊට අමතරව ආයතනය තුළ පැහැදිලිව හඳුනාගත් බරපතල අක්‍රමිකතා රාශියක් මෙම විමර්ශනයන්හී දී කාරක සභාවට නිරීක්ෂණය වීමත් යන කරුණු වේ.

වර්තමානයේ රට තුළ උද්ගතව ඇති ආර්ථික අර්බුදයෙන් මිදී යහපත් ආර්ථිකයක් උදාකිරීම සඳහා රාජ්‍ය ආයතනවල පවතින මූල්‍ය අක්‍රමිකතා හා දූෂණ වැළැක්වීමට නිසි පියවර ගැනීම සියලු රාජ්‍ය නිලධාරීන්ගේ වගකීමක් වන අතර, කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කඩිනම් අවධානය යොමු කිරීම, සුදුසු විනය ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කිරීම හා සියලු ක්‍රියාවන් සම්බන්ධයෙන් පසු විපරම් සිදු කරමින් අදාළ නිර්දේශ/ එකඟතා ක්‍රියාත්මකභාවයට පත් කිරීම කාරක සභාව හමුවට කැඳවනු ලබන ආයතනවල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම වේ.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාර්ථකත්වය රැඳී තිබෙන්නේ ඊට දායක වන සියලුම පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය මත ය. එබැවින්, රාජ්‍ය මූල්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් මෙතෙක් ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පසුගිය ගිණුම් කාරක සභා වල සේවය කළ සභාපතිවරුන් ඇතුළු සභික මන්ත්‍රීවරුන්ටත්, කාරක සභා කටයුතු

සාර්ථකව පවත්වාගෙන යාමට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මා හට පූර්ණ සහයෝගය ලබා දෙන වර්තමාන සභික මන්ත්‍රීවරුන්ටත් මාගේ කෘතඥතාවය පුද කරමි.

තවද, කාරක සභාවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට ලබාදෙන සහයෝගය වෙනුවෙන් විගණකාධිපති ඇතුළු ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ද, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ට ද, පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඇතුලු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ සියලුම නිලධාරීන්ට ද කාරක සභාව සිය ස්තුතිය හා ප්‍රසාදය පිරිනමනු ලබන බව මෙහි ලා සඳහන් කරනු කැමැත්තෙමි.

**කබීර් හෂීම්**
සභාපති
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

## <u>සංක්ෂිප්ත වාර්තාව</u>

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් **2025.02.25, 2025.02.27** සහ **2025.10.08** යන දිනයන්හිදී කොළඹ මහා නගර සභාවේ 2022 සහ 2023 මූල්‍ය වර්ෂයන් සඳහා විගණකාධිපති වාර්තා සලකා බැලීම සහ වර්තමාන කාර්ය සාධනය පිළිබඳ විමර්ශනය කරන ලද අතර, එම කාරක සභා රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද කරුණු, ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා/ ගණන් දීමේ නිලධාරියා විසින් කරන ලද පැහැදිලි කිරීම්, කාරක සභාවේ නිරීක්ෂණ, කාරක සභාවේදී ලබාදෙන ලද නිර්දේශ සහ එම නිර්දේශ ඉටුකිරීමේ ප්‍රගතිය මෙම වාර්තාවේ අඩංගු වේ.

කැඳවන ලද ආයතන -

- රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
- බස්නාහිර පළාත් සභාව
- කොළඹ මහා නගර සභාව

විමර්ශන සහාය: ජාතික විගණන කාර්යාලය

මෙම විමර්ශනයන් සඳහා ඉහත සඳහන් විගණන වාර්තා මගින් අනාවරණය කරන ලද විගණන නිරීක්ෂණ පාදක කොට ගෙන ඇති අතර, කාරක සභා රැස්වීම්වලදී සාකච්ඡාවට ලක් කරන ලද කරුණුවලට අදාල වැඩිමනත් තොරතුරු එම විගණන වාර්තාවල අන්තර්ගත වේ. එම විගණන වාර්තා පහත සබැඳි ඔස්සේ බාගත කරගත හැකිය.

**<u>2022 වර්ෂය:-</u>**

https://auditorgeneral.gov.lk/web/images/audit-reports/upload/2022/locathorities/6-xiii/01.Colombo-MCS.pdf

**<u>2023 වර්ෂය:-</u>**

https://auditorgeneral.gov.lk/web/images/audit-reports/upload/2023/local_authorities/6-XXIII/01.Colombo-MCS.pdf

**<u>විමර්ශනයේදී හඳුනාගත් ප්‍රධාන ගැටළු ආශ්‍රයෙන්,</u>**

- ***a.*** **සාකච්ඡා කරන ලද කරුණු**
- ***b.*** **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**
- ***c.*** **කාරක සභාවේ නිරීක්ෂණ**
- ***d.*** **කාරක සභාවේ තීරණ සහ නිර්දේශ**
- ***e.*** **නිර්දේශ ඉටුකිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

**<u>පිළිබඳ තොරතුරු</u>**

❖ කොළඹ මහා නගර සභාවේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) :-
ලේකම්, රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

❖ කොළඹ මහා නගර සභාවේ ගණන් දීමේ නිලධාරී (ග.නි.) :-
නගරාධිපති, කොළඹ මහා නගර සභාව

## 01. හිඟ වරිපනම් බදු ආදායම් අය කරගැනීම.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.02.25</u>

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

- කොළඹ මහා නගර සභාව තුළ හිඟ ආදායම් අය කර ගැනීමේ දුර්වලතා අඛණ්ඩව නිරීක්ෂණය වීම සහ අයවැයගත හා බිල්කළ වරිපනම් ආදායම් අතර පරතරයක් පැවතීම.
- කොළඹ මහා නගර සභාව භාවිතා කරනු ලබන ආදායම් එකතු කර ගැනීමේ පරිගණක පද්ධතිය හරහා හිඟ ආදායම් සඳහා කාල විශ්ලේෂණයක් ලබා ගත නොහැකි බව.
- පෙර වර්ෂවල වරිපනම් බදු හිඟව පැවතියදී පවත්නා වර්ෂයේ වරිපනම් ගෙවීමේදී වට්ටම් ලබා දීම හිඟ මුදල් නොගෙවීම දිරිමත් කිරීමට හේතු වන බව.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

- වාර්ෂික අයවැය සඳහා වරිපනම් ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී, ඒ වන විට පද්ධතියේ ඇතුළත් වරිපනම් බදු ගෙවනු ලබන දේපළ

ප්‍රමාණය සහ එම වසර තුළ නව ඉදිකිරීම් ලෙස එක්වන බවට ඇස්තමේන්තු කරන දේපළ ප්‍රමාණය සලකා බැලීම අයවැයගත වරිපනම් ආදායම හා බිල්කළ ආදායම අතර පරතරය වැඩි වීමට හේතු වන බව,

- ප්‍රවර්තන වර්ෂයේ ගෙවීම් සිදුකර වට්ටම් ලබා ගැනීමට දේපළ හිමියන් වැඩි කැමැත්තක් දක්වන බවත්, මේ වන විට ප්‍රවර්තන ආදායමේ 80% කට වැඩි ප්‍රගතියක් අත්කර ගෙන ඇති බව,
- පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ අනුව 2024 වර්ෂයේදී දේපළ 80 කට වැඩි ප්‍රමාණයක් මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව පවරා ගැනීමට ක්‍රියා කළ බවත්, මෙම ක්‍රමවේදය හරහා රුපියල් මිලියන 1134 ක හිඟ මුදලක් අය කර ගැනීමට හැකි වූ බව,
- ආදායම් පරිගණක පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව පිළියෙල කළ කාල විශ්ලේෂණයක් මගින් හිඟ ආදායම් කාලානුරූපීව හඳුනාගෙන ඇති බව,
- හිඟ මුදල් ගෙවිය යුතුව ඇති රාජ්‍ය ආයතන අතරින් ඇතැම් ආයතන වාරික වශයෙන් හිඟ මුදල් ගෙවීමට එකඟ වී ඇති බවත්, තවත් ආයතන කිහිපයක් තම හිඟ මුදල් කපා හරින ලෙස ඉල්ලීම් කර ඇති බව,
- හිඟ ආදායම් අය කර ගැනීමට නොහැකි මට්ටමේ පවතින්නේ මීට වසර 10ත් 15ත් අතර කාලසීමාවකට පෙර ලියාපදිංචි කර අඛණ්ඩව ලේඛනවල සඳහන් වෙමින් පැවති දේපළ බව,
- දේපළ සමීක්ෂණයක් මගින් වර්තමානයේ සත්‍ය වශයෙන් නොපවතින දේපළ හඳුනාගෙන ඒවා ලේඛනවලින් ඉවත් කිරීමට සහ දැනට පවතින දේපළ ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන හිඟ වරිපනම් සහිත දේපළ මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව පවරා ගැනීම් සඳහා යොමු වීමට අපේක්ෂා කරන බව,
- මෙම දේපළ සමීක්ෂණයේ කටයුතු ප්‍රමාද වීම සඳහා ආදායම් පරීක්ෂකවරුන්ගේ හිඟය බලපා ඇති බව,
- කොළඹ කොටුව කොට්ඨාශය තුළ වසර 10කට වැඩි කාලයක සිට රුපියල් මිලියන 440ක හිඟ ආදායම් ප්‍රමාණයක් පවතින දේපළ ලැයිස්තුවක් මේ වන විට සකස් කර ඇති බව,
- KOICA ආධාර යටතේ වරිපනම්, ව්‍යාපාර බදු, ව්‍යාපාර බලපත්‍ර හා මුද්දර ගාස්තු සඳහා නව පරිගණක පද්ධතියක් හඳුන්වා දී එය 2027 වර්ෂය වන විට නිම කිරීමට සැලසුම් කර ඇති බව,

ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.

## c. කාරක සභාවේ නිරීක්ෂණ

දේපළ අයිතිය වෙනස් වීමකදී මාස හයක් තුළ පළාත් පාලන ආයතනය වෙත එකී දේපළ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු බවට අතුරු නීතියක් පවතින බැවින් එහි ක්‍රියාකාරීත්වය නියාමනය කිරීම සඳහා යාන්ත්‍රණයක් පැවතිය යුතු බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.

## d. කාරක සභාවේ නිර්දේශ

1. දේපළ සමීක්ෂණ කටයුතු සඳහා සේවකයින් බඳවා ගැනීමට අවශ්‍ය කරන පහසුකම් සලසා දීමට කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව උපදෙස් දුන්නේය.
2. කාල විශ්ලේෂණයක් අනුව දීර්ඝ කාලයක සිට පැවත එන හිඟ මුදල් ප්‍රමාණ අයකර ගැනීමට ප්‍රමුඛතාවය ලබා දී හිඟ ආදායම් අය කර ගැනීමේ සැලැස්මක් සකස් කරන ලෙසත්,
3. මේ වන විට දේපළ හඳුනාගැනීම සිදු කර ඇති බවට සඳහන් කළ කොළඹ කොටුව ප්‍රදේශයේ හිඟ ආදායම් අය කරගැනීමේ කටයුතු මාස 6ක් ඇතුළත අවසන් කරන ලෙසත්,
4. අනෙකුත් ප්‍රදේශවලට අදාළව දේපළ සමීක්ෂණයේ කටයුතු නිශ්චිත කාලරාමුවක් ඇතුළත අවසන් කරන ලෙසත්,
5. දැනට එක් රැස් කර ඇති සමස්ත දත්ත පිළිබඳ වාර්තාවක් (දේපළේ නම්, හිමිකරුවන්ගේ නම් සහ වසරින් වසර හිඟ බදු ප්‍රමාණයන් ඇතුළත්ව) සහ හිඟ ආදායම් පවතින දේපළ පිළිබඳ සමීක්ෂණයේ මාර්ග සැලැස්ම සතියක් තුළ (2025.03.04 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්,

කාරක සභාව නිර්දේශ කළ අතර, ප්‍ර.ග.නි./ ග.නි. ඒ සමඟ එකඟ විය.

## e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- මාසයක් ඇතුළත අදාළ හිඟයෙන් 25% ක් අයකර ගත යුතු බවට කොළඹ කොටුව ප්‍රදේශයේ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා පත් කර ඇති නිලධාරියා වෙත දැනුම් දී ඇති බවත්, ඉල්ලීම් නිවේදන (Demand Notice) බෙදාදීමට කටයුතු කර ඇති බවත් කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025 හා 2025.03.15 දිනැති ලිපියෙන් වාර්තා කර ඇත.

- දේපල භෞතිකව නොමැති නම්, ඒ සම්බන්ධයෙන් වාර්තා ලබා දීමටත් එසේම නිවේදන ලබා නොගන්නා අවස්ථා තිබේනම් ඒ අවස්ථා වෙන් වෙන්ව දක්වන ලෙස ආදායම් පරීක්ෂකවරුන්ට හා අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇති අතර දේපල වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට කටයුතු කර ඇත.
- දේපළ හිමිකරුවන් ඇතුළු තොරතුරු සහිතව විස්තරාත්මක වාර්තාවක් එවා නොමැති අතර, ඉහත ලිපියෙන් 2024.12.31 දිනට හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ/ දේපළ සමීක්ෂණය කිරීම සඳහා 2025 වර්ෂයට අදාළව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ඉහත ලිපියෙන් කාරක සභාව වෙත යොමුකර ඇත.
- හිඟ ආදායම් අය කර ගැනීමේ සැලැස්මක් සකස් කිරීම සම්බන්ධ ප්‍රගතිය වාර්තා කර නොමැත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.10.08</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

- පසුගිය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී (2025.02.25) ලබාදුන් නිර්දේශය පරිදි හිඟ වරිපනම් බදු ආදායම් අය කර ගැනීමේ සැලැස්ම සඳහා නිවැරදි කාල විශ්ලේෂණයක් සකස් කර නොමැති බැවින්, නිශ්චිත වගකීම් පවරා එහි ප්‍රගතිය පසු විපරම් කිරීමේ අපහසුතා ඇති වන බව.
- කොළඹ මහා නගර සභාවේ කොට්ඨාශ 47න් අය විය යුතු සමස්ත හිඟ වරිපනම් මුදල රුපියල් බිලියන 4කට ආසන්න බව.
- පසුගිය කාරක සභා රැස්වීමේදී මාස 6ක් තුළ හිඟ ආදායම් එකතු කර අවසන් කිරීමට එකඟ වූ කොළඹ කොටුව කොට්ඨාශයේ පැවති හිඟ ආදායම් රුපියල් මිලිනය 610ක් පමණ වන ප්‍රමාණයෙන් මෙම වර්ෂයේ ජුනි මස වන විට අයකරගෙන ඇති බවට වාර්තා වී ඇත්තේ රුපියල් මිලියන 53ක් පමණක් බව.
- ආදායම් එකතු කිරීම සහ ඊට අදාළ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයේ පවතින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා වත්මන් පාලන අධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

- හිඟ වරිපනම් බදු ආදායම් අයකරගත හැකිවනුයේ මහා නගර සභා ආඥා පනත යටතේ බදු නොගෙවන්නන්ගේ දේපළ තහනම් කිරීමේ ක්‍රමවේදය අනුව බව,

- වසරකට පස්වතාවක් සිදු කරනු ලබන දේපළ හඳුනාගැනීමේ සමීක්ෂණය යටතේ 2024.12.31 දිනට පැවති ශේෂය සඳහා දේපළ තහනම් කිරීමේ ක්‍රමවේදය අනුගමනය කළ බව,
- කොළඹ කොටුව ප්‍රදේශයේ දේපළ 3047ක් වර්ගීකරණය කර මෙම වර්ෂයේ සැප්තැම්බර් මස තිස් වන දිනට එම කොට්ඨාශයෙන් රුපියල් මිලියන 148ක හිඟ මුදල් අය කරගෙන ඇති බව,
- කොට්ඨාශ 47හි දැනට ආරම්භ කර ඇති දේපල සමීක්ෂණයේ කටයුතු මාස කිහිපයක් ඇතුළත අවසන් කිරීමට අපේක්ෂා කරන බව,
- මීට මාස දෙකකට පෙර ගිවිසුම් අත්සන් කරන ලද KOICA ආයතනය මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියෙන් වරිපනම් ඇතුළු ආදායම් මාර්ග 4ක් පමණක් ආවරණය වන බව සහ එය වසර හතරක් තුළ පියවර වශයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් බව,
- නව පද්ධතිය හා පැරණි පද්ධතිය ඒකාබද්ධ කිරීම පිළිබඳව මහා නගර සභාව වෙනුවෙන් අමාත්‍යාංශයෙන් පත්කළ උපදේශකවරයෙකුගේ සහාය ඇතිව අදාළ ස්ථාවර කමිටුව සහ නිලධාරීන් විසින් සමාලෝචනය කරනු ලබන බව,
- කොළඹ මහා නගර සභාව සතු සියලු ඉඩම්වල මැනුම් හා තක්සේරු කටයුතු මෙම වසර තුළ අවසන් කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන අතර ඒ හරහා අනවසර ඉදිකිරීම් හඳුනාගත හැකි වන බව,
- අනවසර පදිංචිකරුවන් ක්‍රමානුකූලව නැවත පදිංචි කරවීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම පිළිබඳව කටයුතු කරමින් පවතින බව සහ අලුතින් අනවසර ඉදිකිරීම් සිදු කරනු ලබන පුද්ගලයින් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව,
- ආදායම් එකතු කිරීමේ පසු විපරම් ක්‍රියාවලියේ පවතින ගැටලු සහ ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් ඒ සම්බන්ධයෙන් පත් කර ඇති ස්ථාවර කමිටුවක් මඟින් සකස් කරනු ලබන බව,

ග.නි. ප්‍රකාශ කළාය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

දේපළ සමීක්ෂණය කාලීනව සිදුකිරීම සඳහා දැනට ආයතනය තුළ විධිමත් ක්‍රමවේදයක් සකස් වී නොමැති බවත්, කාලීනව දේපළ අධීක්ෂණය කර නිශ්චිත වාර්තා කිරීමේ ක්‍රමවේදයක් ඉදිරියේදී අනුගමනය කළ හැකි නම් විසඳුමක් ලබාගැනීමට හැකි වන බවත් කාරක සභාව විසින් ප්‍රකාශ කරන ලදී.

### d. කාරක සභාවේ නිර්දේශ

1. KOICA ආයතනය සමඟ සකස් කරනු ලබන දත්ත පද්ධතිය හරහා වරිපනම් ආදායම් එකතුකර ගැනීමේ කාර්ය සාධනය වර්ධනය කර ගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකසා ගැනීමත්,
2. කොළඹ මහා නගර සභාවේ අනෙකුත් ආදායම් ශීර්ෂ 78 සඳහා ද ආදායම් එකතු කිරීම සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම පිළිබඳ සලකා බැලීමට පත් කර ඇති ස්ථාවර කමිටුව හරහා එම ආදායම් ශීර්ෂවල වැදගත්කම අනුව ප්‍රමුඛතාවය ලබාදෙමින් ආදායම් එකතු කිරීමේ විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමත්,
3. හඳුනාගත නොහැකි දේපළ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා අදාළ ස්ථාවර කමිටුව හරහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමත්,

යන කරුණු සම්බන්ධයෙන් වන ප්‍රගතිය වාර්තා කිරීමේ හැකියාව පිළිබඳව කාරක සභාව විමසූ අතර, මාස 03ක් ඇතුළත (2026.01.08 දිනට පෙර) මේ සම්බන්ධ අතුරු වාර්තාවක් සහ මාස 06ක් තුළ (2026.04.08 දිනට පෙර) එහි අවසන් වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට ග.නි., කාරක සභාව හා එකඟ විය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025/02 හා 2026.01.09 දිනැති ලිපියෙන් පහත කරුණු වාර්තා කර ඇත;

1. කොළඹ මහා නගර සභාව තුළ e-Tax පද්ධතියක් ස්ථාපනය කිරීමට අදාළව මෘදුකාංගය සංවර්ධනය කිරීම සඳහා KOICA ආයතනය විසින් 2026.01.05 දින මූලික සැලැස්මක් ලබා දී ඇති බව,
2. ආදායම් කමිටුව මඟින් ආදායම් එකතු කිරීම කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශයක් මහා සභාවට ඉදිරිපත් කර ඇති බව,
3. සමීක්ෂණ මඟින් හඳුනාගත නොහැකි දේපළ 3,797ක් වාර්තා වී ඇති අතර, එයින් පළමු අදියර ලෙස දේපළ 1,671ක් පිළිබඳ තොරතුරු නාගරික කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති බව.

## 02. මහා නගර සභාව සතු ඉඩම් 168 සම්බන්ධ ගැටලු

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.02.25

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

- මහා නගර සභාව සතු ඉඩම් නිරවුල් කරගැනීම සම්බන්ධව වර්තමාන ප්‍රගතිය.

### b. ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණකන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

- ලේඛන පරීක්ෂා කිරීමේදී මෙම ඉඩම් 168න් මහා නගර සභාව සතු දේපළ ලෙස ඉඩම් 132ක් පමණක් පවතින බව හඳුනාගෙන ඇති බව,
- ඉඩම්වල අයිතිය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට දැනුම් දී මිනුම් කටයුතු ආරම්භ කර ඇති බව,
- මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් මිනුම් කටයුතුවල ප්‍රමාදයක් ඇති වූ බැවින් පෞද්ගලික මිනින්දෝරු ආයතන මේ සඳහා ලියාපදිංචි කර ගන්නා ලද බව,
- මිනුම් කටයුතු සියල්ල මේ වසර තුළ අවසන් කිරීමට අපේක්ෂා කරන බව,
- මිනුම් කටයුතු අතරතුර එම ඉඩම්වල අනවසර පදිංචිකරුවන් හඳුනා ගැනීම ද සිදු කරනු ලබන බව,

ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

කොළඹ මහා නගර සභාව සතු හඳුනාගත් ඉඩම්වල මැනුම් කටයුතු සිදුකර ඒවායේ අයිතිය නිරවුල් කරගත යුතු බව කාරක සභාව නිරීක්ෂණය කළේය.

### d. කාරක සභාවේ නිර්දේශ

හඳුනාගත් ඉඩම්වල මැනුම් කටයුතු අවසන් කර නිරවුල් කර ගැනීමට අදාළ වන ක්‍රියාපිළිවෙල සඳහා කාල රාමුවක් සකස් කර සතියක් තුළ (2025.03.04 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නිර්දේශ කළ අතර, ප්‍ර.ග.නි./ ග.නි. ඒ සඳහා එකඟ විය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025 හා 2025.03.15 දිනැති ලිපියෙන් ඉඩම් මැනුම් කිරීමේ හා ලේඛන යාවත්කාලීන කිරීමේ කටයුතු 2025 වසර තුළ අවසන් කිරීමට අදාළ ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර ඇත.

## 03. මෝදර එලිහවුස් ඉඩම (Elie House)

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.02.25</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

- මෙම ඉඩම බදු පදනම මත ලබා ගෙන ඇති පුණ්‍ය ආයතනය විසින් 1997 වර්ෂයේ සිට ගිවිසුම්ගත ඉඩම් ප්‍රමාණය වූ පර්: 50 ඉක්මවා අනවසරයෙන් වැඩිපුර දේපළ ප්‍රමාණයක් (පර්: 40ක්) භුක්ති විඳින බවට වාර්තා වී තිබීම.
- මෙම භූමියේ අනවසරයෙන් ඉදිකර භුක්ති විඳිනු ලබන දේපළවල වැඩිහිටි නිවාසයක් සහ පෙර පාසලක් පවත්වාගෙන යන බැවින් එම දේපළ අත්පත් කර ගැනීමේදී සදාචාරාත්මක ගැටලුවක් පැන නගින බව.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

- අදාළ පුණ්‍ය ආයතනය සමඟ ඇති බදු ගිවිසුම කල් ඉකුත් වී ඇති බැවින්, ගිවිසුම දීර්ඝ කිරීම සඳහා අනවසර භුක්තිය පැවති කාලයට අදාළව පර්: 40ක කොටස සඳහා කුලිය ලෙස තක්සේරු කරන ලද රුපියල් මිලියන 12ක මුදලක් මහා නගර සභාව වෙත ගෙවන ලෙස එම ආයතනයට දැන්වූවද, ආයතනය ඒ සඳහා එකඟ නොවීම හේතුවෙන් එම දේපළ පවරා ගැනීමට කටයුතු කරන බවට ලිඛිතව දැනුම් දුන් බව,
- මෙම කරුණ සම්බන්ධයෙන් එකී ආයතනය විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබීම හේතුවෙන් අදාළ පරීක්ෂාවන් සිදු කරන තෙක් දේපළ පවරා ගැනීම තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා ඇති බව,
- අනවසරයෙන් භුක්ති විඳිනු ලබන්නා වෙත අනවසර භුක්තියේ වටිනාකම එකතු කර එම දේපළ නියමානුකූල කිරීමේ අදහසින් අනවසර භුක්තියට අදාළ මුදල ගෙවන ලෙස දන්වා ඇති බව සහ මෙම මුදල කොළඹ මහා නගර සභාවට අයවිය යුතුව තිබූ ආදායමක් බැවින්,

කුලියක් ලෙස නොව, නගර සභාවට වූ අලාභය සලකා දඩයක් ලෙස එය අය කර ගත හැකි බව,

ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

එම භූමිය තුළ අනවසර ඉදිකිරීම් සිදු කරන අවස්ථාවේදී නිසි ක්‍රියා මාර්ග නොගැනීම හරහා කොළඹ මහා නගර සභාව තම කාර්යභාරය පැහැර හැර ඇති බව කාරක සභාව අවධාරණය කළේය.

### d. කාරක සභාවේ නිර්දේශ

1. මෙම ඉඩම තුළ අනවසරයෙන් භුක්ති විඳින දේපළ සම්බන්ධව ඉදිරිපත් කර ඇති අභියාචනය පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා සමඟ පැවැත්වීමට නියමිත සාකච්ඡාවෙන් අනතුරුව, එම දේපළ කොළඹ මහා නගර සභාව වෙත පවරා ගැනීම පිළිබඳව එකඟතාවයකට පැමිණ ඒ සම්බන්ධව කාරක සභාව දැනුවත් කරන ලෙසත්,
2. එම ක්‍රියාවලිය අතරතුර, මහා නගර සභාවට අයත් භූමියක් අනවසරයෙන් භුක්ති විඳීමට අදාළව කොළඹ මහා නගර සභාවට අයවිය යුතු දඩ මුදල ලබාගැනීම සඳහා මාසයක් ඇතුළත අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්,

කාරක සභාව නිර්දේශ කළ අතර, ප්‍ර.ග.නි./ ග.නි. ඒ සඳහා එකඟ විය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025 හා 2025.03.15 දිනැති ලිපියෙන් පහත කරුණු වාර්තා කර ඇත;

1. අනවසයෙන් භුක්ති විඳින දේපළ කොටස සඳහා මායිම් සකස් කර ඇති අතර ඒ අනුව එම කොටසට අදාළ ඉඩමේ සැලැස්ම සකස් කිරීම සිදු කෙරෙමින් පවතින බව,
2. අනවසරයෙන් පරිහරණය කරන ලද භූමි ප්‍රමාණය මහා නගර සභාවට පවරා ගැනීමට නියෝග කර ඇති අතර එම භූමි ප්‍රමාණය සඳහා වූ හිඟ බදු කුලී මුදල ද ගෙවන ලෙස අදාළ ආයතනය වෙත දන්වා ඇති බව.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.10.08</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

- 2025 පෙබරවාරි 25 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෝදර එලිහවුස් ඉඩම සම්බන්ධයෙන් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

- මෙම ඉඩම සඳහා සැලැස්මක් නොතිබූ බැවින් නැවත මැනුම් කර, ඉඩම් කොටස් තුනක් වශයෙන් සැලසුම් තුනක් සකස් කර තක්සේරු කටයුතු සිදු කළ බව,
- ඉඩමේ බදුකරු වන පුණ්‍යායතනය ගරු ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කර තිබූ අභියාචනය සලකා බලා එම ආයතනය සමඟ එකඟ වූ පරිදි ගිවිසුම් කාලසීමාව ඉකුත් වී ඇති පර්චස් 50 සම්බන්ධයෙන් සියලුම හිඟ මුදල් මේ වන විට අය කර ගෙන ඇති බව,
- අනවසර භුක්තියට අදාළව අය කර ගැනීම සඳහා රුපියල් මිලියන 12ක් ලෙස ගණනය කර තිබූ දඩ පොලිය එම අභියාචනය අනුව පත්කළ කමිටුවක් මඟින් 1992 වර්ෂයේ සිට ඉදිරි එක් එක් වර්ෂයේ කුලිය පදනම් කරගෙන නැවත ගණනය කර රුපියල් මිලියන 4.3ක් ලෙස තක්සේරු කර ඇති බව සහ එය මහා නගර සභාවේ මුදල් කාරක සභාවට සහ මහ සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව බදුකරු විසින් භාවිතා කරනු ලබන ඉඩම් කොටස් දෙක ඒකාබද්ධව පර්චස් 90ක් සඳහා අදාළ බදුකරු සමඟ විධිමත් ලෙස ගිවිසුම් ගතවීමට අපේක්ෂා කරන බව,
- මෙම ආයතනය ප්‍රදේශයේ ජනතාව උදෙසා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබන පුණ්‍යායතනයක් බැවින් එහි පැවැත්මට හානිකර නොවන පරිදි ක්‍රියා කිරීමට තීරණය කරන ලද බවත්,

ග.නි. ප්‍රකාශ කළාය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

මෙම ඉඩම අලුතින් මැනීමේදී හඳුනාගත් ඉතිරි පර්චස් 50ක ඉඩම් කොටස ආදායම් උත්පාදන මාර්ගයක් සඳහා උපයෝගී කර ගත යුතු බව කාරක සභාව පෙන්වා දුන්නේය.

**d. කාරක සභාවේ නිර්දේශ**

අදාළ බදුකරුගෙන් දඩ පොලිය අයකර ගැනීම සඳහා කොළඹ මහා නගර සභාවේ මුදල් කාරක සභාවේ සහ මහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ඒ සම්බන්ධව ගනු ලබන තීරණය සහ ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් වන ප්‍රගතිය පිළිබඳව 2025.12.31 දිනට පෙර කාරක සභාව වෙත වාර්තා කිරීමට ග.නි. කාරක සභාව හා එකඟ විය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාළ බදුකරුගෙන් දඩ පොලිය අයකර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කොළඹ මහා නගර සභාවේ මුදල් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති බව කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025/02 හා 2026.01.06 දිනැති ලිපියෙන් වාර්තා කර ඇත.

## 04. බොරැල්ල සුසාන භූමි පාලකගේ නිල නිවාසය හා ඉඩම අවභාවිතා කිරීම

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.02.25</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

- කොළඹ මහා නගර සභාවේ සේවකයෙකු විසින් බොරැල්ල සුසාන භූමි පාලකගේ නිල නිවස හා අදාළ රජයේ ඉඩම භාවිතා කරමින් ‘‘සුප්‍රීම් මල්ශාලාව’’ නම් පෞද්ගලික මල්ශාලාවක් පවත්වාගෙන යනු ලබන බව විගණන වාර්තාවකින් අනාවරණය වී තිබීම.
- මේ පිළිබඳව 2023.06.06 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ ලබාදී ඇති නමුත් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

- මෙම ව්‍යාපාරය සඳහා නගර සභාවෙන් අවශ්‍ය බලපත්‍ර ලබා නොමැති අතර, එය බොරැල්ල සුසාන භූමි පාලක ලෙස කටයුතු කළ අදාළ සේවකයා විසින් ඔහුගේ පවුලේ සාමාජිකයින්ගේ හවුල් ව්‍යාපාරයක් ලෙස ද ක්‍රියාත්මක වී ඇති බව,

- මෙම ව්‍යාපාර කටයුතු සඳහා සුසාන භූමි පාලක නිල නිවස ද භාවිතා කර ඇති බව,
- ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සභාපතිත්වයෙන් විමර්ශන කමිටුවක් පත් කර මේ සම්බන්ධව මූලික විමර්ශනයක් සිදු කර, එහි නිර්දේශ වශයෙන් ඉඩම නගර සභාව වෙත පවරා ගැනීමට සහ සේවකයා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරන ලද නමුත්, මෙම පුද්ගලයාට එරෙහිව විධිමත් චෝදනා පත්‍රයක් නිකුත් කිරීමක් එවක සිදුව නැති බව,
- පසුව 2020 වර්ෂයේදී ප්‍රශ්නගගත සේවකයාගේ වැඩ තහනම් කරන ලද අතර ඊට එරෙහිව එම සේවකයා විසින් මහාධිකරණයේ නඩු පවරන ලද බව සහ එවකට පත්ව සිටි නාගරික කොමසාරිස් සමඟ සිදු කළ සාකච්ඡාවකින් පසුව ඇති වූ සමථයක් අනුව එම නඩුව ඉල්ලා අස් කර ගෙන අදාළ සේවකයා නැවත සේවයේ පිහිටුවා ඇති බව,

ග.නි. ප්‍රකාශ කළේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

ප්‍රශ්නගත සේවකයා සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් කොළඹ මහා නගර සභාව විසින් සිදුකළ යුතු බව.

### d. කාරක සභාවේ නිර්දේශ

1. මෙම කරුණට අදාළව විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ විනය පරීක්ෂණ නිලධාරී සංචිතයෙන් අවශ්‍ය නිලධාරීන් ලබා දීමට කටයුතු කරන ලෙස කාරක සභාව කළ නිර්දේශය සමඟ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් එකඟ විය.
2. මෙම කරුණට අදාළව සම්පූර්ණ පරීක්ෂණයක් සිදුකිරීම සඳහා කමිටුවක් පත් කර එහි පරීක්ෂණ වාර්තාව සති දෙකක් තුළ (2025.03.11 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව කළ නිර්දේශය සමඟ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් එකඟ විය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර ඇති විනය පරීක්ෂණ නිලධාරීන්ගේ නාම ලේඛනයෙන් සුදුසු නිලධාරියෙකු මෙම පරීක්ෂණය සඳහා පත් කර ගන්නා ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PL/7/4/8/1-2025 හා

2025.03.24 දිනැති ලිපියෙන් කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් දැනුවත් කර ඇත.

- මෙම කරුණට අදාළව සම්පූර්ණ පරීක්ෂණයක් සිදුකිරීම සඳහා පත්කරන ලද ත්‍රිපුද්ගල කමිටුව මගින් ලබාදුන් නිර්දේශ සහිත සවිස්තරාත්මක අවසන් වාර්තාව බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/FIN-AP/01/FI/18(D) හා 2025.10.03 දිනැති ලිපියෙන් ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.02.27</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

- සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් යටතේ සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇති එහෙත් අවශ්‍ය අනෙකුත් අවශ්‍යතා සපුරා නොමැති ආයතනයකට මල්ශාලාවක් පවත්වාගෙන යාම සඳහා ඉඩ ප්‍රස්ථා ලබාදී තිබීම මගින් හා මෙම සිද්ධියට අදාළ සේවකයා නැවත සේවයේ පිහිටුවීම තුළින් නගර සභාව බරපතල වරදක් සිදුකර ඇති බව.
- මෙම අනවසර දේපළ මහා නගර සභාව වෙත පවරා ගැනීම පිළිබඳව ගෙන ඇති ක්‍රියාමාර්ග.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

- අදාළ පාර්ශ්වය විසින් මෙම දේපළ අයිතිය සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ ව්‍යාජ ඔප්පු බවට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය හරහා තහවුරු කරගත් බවත්,
- මෙම පරිශ්‍රයේ පිහිටා ඇති මහා නගර සභාවට අයත් දේපළක් වන සුසාන භූමි පාලක නිල නිවාසය 1998.08.11 දින සිට නිල නිවාස ගිවිසුමකින් ප්‍රශ්නගත පුද්ගලයා වෙත පවරා දීමෙන් අනතුරුව මෙම අනවසර ඉදිකිරීම සිදු කර ඇති අතර මෙම මල්ශාලාව සඳහා අංක 2-2 නම් ව්‍යාජ වරිපනම් අංකයක් භාවිතා කරන බව සහ මල්ශාලාවේ කටයුතු සඳහා නිල නිවාසය ද භාවිත කර ඇති බවත්,
- ප්‍රශ්නගත පුද්ගලයා විසින් තම අයිතිය සැඟවීම සඳහා මෙම ව්‍යාපාරයේ නම සහ හිමිකාරීත්වය වරින් වර වෙනස් කර ඇති බවත්,
- ප්‍රශ්නගත පුද්ගලයා සුසාන භූමියේ සේවාවන් ලබා දීම සඳහා ව්‍යාජ රිසිට්පත් නිකුත් කර මුදල් ලබාගැනීමේ චෝදනාවක් සම්බන්ධයෙන්

වැඩ තහනමට ලක් කළ බව සහ ඔහු සම්බන්ධව තවත් විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධ විමර්ශන පවතින බවත්,

- අභ්‍යන්තර විනය පරීක්ෂණයක් මඟින් වැඩ තහනම් කර චෝදනා පත්‍රය නිකුත් කළ ද එය භාර ගැනීම ඔහු විසින් දිගින් දිගටම මඟ හැර සිටි අතර පසුව ඔහු විසින් ඒ සම්බන්ධව නඩුවක් ගොනු කරන ලද බවත්,

හිටපු නාගරික කොමසාරිස් ආචාර්ය රෝෂනී දිසානායක මහත්මිය කාරක සභාව හමුවේ අනාවරණය කළාය.

- අදාළ පුද්ගලයා විසින් වැඩ තහනම් කිරීමට එරෙහිව පවරන ලද නඩුව ඉල්ලා අස්කර ගැනීමේදී අනුප්‍රාප්තික නාගරික කොමසාරිස් සමඟ පූර්වයේ ඇති කර ගත් සමථයේ කොන්දේසි ලෙස ඔහු නැවත රැකියාවේ පිහිටුවීම, ඔහු විසින් ස්ථාන මාරුව පිළිගැනීම සහ චෝදනා පත්‍ර භාර ගැනීම යන කරුණු සඳහන් කර ඇති අතර එම සමථ කොන්දේසි ඔහු විසින් සම්පූර්ණ කර ඇති බව කොළඹ මහා නගර සභාවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.
- සුප්‍රීම් මල්ශාලාව පිහිටි භූමිය මහා නගර සභාවට අයත් දේපළක් බවට මහා නගර සභාවේ පැවති ලේඛන 11ක් මඟින් එවකට නාගරික තක්සේරුකරු විසින් තහවුරු කර ඇති බව හිටපු නාගරික කොමසාරිස් ප්‍රකාශ කළාය.
- මෙම අනවසර ඉදිකිරීම පිහිටා ඇති භූමිය කොළඹ මහා නගර සභාවට භුක්තිය පමණක් හිමි රජයේ ඉඩමක් බැවින් ඒ සඳහා මහා නගර සභාවේ අයිතිය පෙන්වීම සඳහා පැවරුම් ඔප්පුවක් ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් රැසක් ඉදිරිපත් කළ නමුත් මෙතෙක් ඒ සඳහා ලේඛනයක් ලැබී නොමැති බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.
- මෙම ව්‍යාපාරය සඳහා කොළඹ මහා නගර සභාව මඟින් මල්ශාලාවක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා දී නොමැති බව ද මෙහිදී කොළඹ මහා නගර සභාවේ නිලධාරීහු තහවුරු කළහ.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

නොපමාව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ කළ ද, ඒ සඳහා කටයුතු නොකිරීම තුළින්, එවකට නාගරික කොමසාරිස් විසින් සාමාන්‍ය විමර්ශන ක්‍රමවේදයට පරිබාහිරව ක්‍රියා කිරීමට කටයුතු කර ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

### d. කාරක සභාවේ නිර්දේශ

1. අදාළ සේවකයාට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර නොමැති බැවින්, එවකට සිටි නාගරික කොමසාරිස්වරිය ඇතුළු පරිපාලනමය වගකීම් දරන ලද අනෙකුත් නිලධාරීන් විසින් මෙම

කරුණ සම්බන්ධව නිවැරදි ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන්න හා මෙම කරුණ සම්බන්ධව එම නිලධාරීන් විසින් චේතනාන්විතව යම් අත්හැරීම් හෝ වැරදි සිදු කර තිබේ ද යන්නත්, එසේ නම්, ඒ සම්බන්ධව එම නිලධාරීන්ට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග කවරේ ද, යන කරුණු පිළිබඳව 2025.02.25 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් ඉදිරිපත් කිරීමට එකඟ වූ පරීක්ෂණ වාර්තාව මඟින් අවධානය යොමු කළ යුතු බවට කාරක සභාව උපදෙස් දුන්නේය.

2. මෙම කරුණට අදාළ වන සුසාන භූමි පාලක සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඒ පිළිබඳ වාර්තාවක් සතියක් තුළ (2025.03.04 දිනට පෙර) ලබා දෙන ලෙසත්,

3. ප්‍රශ්නගත මල්ශාලාව අනීතික ව්‍යාපාරයක් බවට තහවුරු වී ඇති බැවින් පවතින නීතිරීතිවලට අනුව එම ව්‍යාපාරය තහනම් කිරීමට අදාළ ක්‍රියාමාර්ගය 2025.02.28 දිනම ආරම්භ කරන ලෙසත්,

කාරක සභාව නිර්දේශ කළ අතර කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් ඒ සඳහා එකඟ විය.

4. හිටපු නාගරික කොමසාරිස්, ආචාර්ය රෝෂනී දිසානායක මහත්මිය විසින් කාරක සභාවේ විමර්ශන කටයුතු සඳහා ලබාදුන් සහයෝගය අගය කළ කාරක සභාව, එම නිලධාරිනිය වෙත ප්‍රශංසා ලිපියක් ලබා දීමට කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත නිර්දේශ කළේය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

1. බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/FIN-AP/01/FI/18(D) හා 2025.10.03 දිනැති ලිපියෙන් ඉදිරිපත් කර ඇති පරීක්ෂණ වාර්තාවෙන් කාරක සභාවෙන් නිර්දේශිත කරුණු සම්බන්ධයෙන් වාර්තා කර ඇත.

2. විධිමත්ව නිවාඩු අනුමත කරවා ගැනීමකින් තොරව 2025.02.27 දින සිට රාජකාරිය සඳහා වාර්තා කොට නොමැති වීම හේතුවෙන් අදාළ සුසාන භූමි පාලක වෙත කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් 2025.03.04 දිනැතිව තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කර ඇති බව කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/ 2025 හා 2025.03.15 දිනැති ලිපියෙන් වාර්තා කර ඇත.

3. බලපත්‍ර රහිතව අප්‍රසන්න කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා ස්ථානයක් පාවිච්චි කිරීම යටතේ 2025.03.07 දින, නඩු අංක 12970/25 මඟින් කොළඹ මාළිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනුකර ඇති බව කොළඹ මහා නගර සභාවේ නාගරික

කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025 හා 2025.03.15 දිනැති ලිපියෙන් වාර්තා කර ඇත.

4. හිටපු නාගරික කොමසාරිස්, ආචාර්ය රෝෂනී දිසානායක මහත්මිය වෙත ලබා දුන් ප්‍රශංසා ලිපියේ පිටපතක් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) ගේ අංක PL/7/4/8/1-2025 හා 2025.05.08 දිනැති ලිපියෙන් යොමු කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.10.08</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

- බොරැල්ල සුසාන භූමි පාලකගේ නිල නිවාසය සහ ඉඩම අවභාවිතා කිරීමට අදාළව 2025 පෙබරවාරි 25 හා 27 දිනවල පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වලදී ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**

- 2025.02.25 සහ 27 දිනයන්හිදී පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වලදී ලබාදුන් නිර්දේශය අනුව මෙම කරුණ සම්බන්ධව සකස් කරන ලද පරීක්ෂණ වාර්තාව 2025.10.07 දිනැතිව කාරක සභාව වෙත ඉදිරිපත් කළ බවත්, එම කමිටු වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරන බවත් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ප්‍රකාශ කළේය.
- ප්‍රශ්නගත නිලධාරියා (සුසාන භූමි පාලක) අනුමැතියකින් තොරව අධික නිවාඩු සංඛ්‍යාවක් ලබාගනිමින් සේවයට වාර්තා නොකිරීමේ ප්‍රවණතාවයක් දක්වා ඇති බැවින් 2025 මාර්තු 04 වැනි දින සිට සේවය හැර ගියා සේ සලකා නිවේදනය නිකුත් කළ නමුත්, අදාළ නිලධාරියා සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා එය බාධාවක් වන බවට විනය පරීක්ෂණ මණ්ඩලය විසින් දැනුම් දෙන ලද බැවින්, සේවය හැර ගියා සේ සැලකීම අවලංගු කර අදාළ දින සිටම ක්‍රියාත්මක වන පරිදි එම නිලධාරියා වෙත වැඩ තහනම් කිරීමේ නියෝගයක් පසුගිය සතියේ නිකුත් කළ බව,
- කොළඹ මහා නගර සභාව සතුව භුක්තිය පවතින අදාළ ඉඩම ප්‍රාදේශීය ලේකම්ගේ පිඹුරුපතේ රජයේ ඉඩමක් ලෙස දක්වා ඇති බව සහ එය කොළඹ මහා නගර සභාව වෙත පවරා ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතින බව,

ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

- 2025 පෙබරවාරි 25 හා 27 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශවලට අදාළ වාර්තා ලබාදීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් විසින් අකාර්යක්ෂම ලෙස කටයුතු කර ඇති බව.
- දැනට පවතින අතුරු ව්‍යවස්ථා යටතේ මල්ශාලාවක් පවත්වාගෙන යාම ආවරණය වන පරිදි නීති රාමුවක් සකස් වී නොමැති බැවින් අදාළ නීති පද්ධතීන් යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය.

### d. කාරක සභාවේ නිර්දේශ

1. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කර ප්‍රශ්නගත දේපළ කොළඹ මහා නගර සභාවට පවරා ගැනීමේ ක්‍රියාමාර්ගය කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය කටයුතු කිරීමට ග.නි. කාරක සභාව හා එකඟ විය.
2. කොළඹ මහා නගර සභාව කාරක සභාව වෙත ඉදිරියේ කැඳවනු ලබන අවස්ථාවකදී මෙම කාර්යයේ ප්‍රගතිය සමාලෝචනයට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කැඳවීමට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

ඉහත නිර්දේශ සම්බන්ධයෙන් ප්‍රගතිය සොයා බැලීමට කොළඹ මහා නගර සභාව නැවත කාරක සභාව හමුවට කැඳවිය යුතු බවට කාරක සභාව විසින් තීරණය කළේය.

**05. බොරැල්ල සුසාන භූමියේ මළසිරුරු භූමදානය කිරීමට බදු දී ඇති ස්ථාන සහ භෂ්මාවශේෂ තැන්පත් කිරීමට අවසර දී ඇති ස්ථාන.**

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.02.25

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

බොරැල්ල සුසාන භූමියේ ස්මාරක ඉදිකිරීම සඳහා බිම් කොටස් ලබා දීමේ ක්‍රමවේදය.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

- බොරැල්ල සුසාන භූමියේ ස්මාරක ඉදිකිරීම සඳහා එක් එක් අය වෙත පවරා ඇති බිම් ප්‍රමාණය අනුව ඔප්පුවක් ලබා දෙන බව,
- 1872 වර්ෂයේ සිට මේ දක්වා ඔප්පු 9514ක් එසේ නිකුත් කර ඇති බව,
- මේ යටතේ අඩි 2 x 2 ඉඩම් කොටසක් සඳහා රුපියල් 500,000ක් සහ එකතු කළ අගය මත බදු (VAT) අය කරනු ලබන බව,
- මෙම ඔප්පු විකිණීම හෝ නැවත පවරා දීම සිදු කළ නොහැකි බව,

ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

බොරැල්ල සුසාන භූමියේ ඇති සීමිත ඉඩකඩ ප්‍රමාණය ස්මාරක ඉදිකිරීම සඳහා පුද්ගලයින් වෙත ඔප්පුවක් මඟින් ලබාදීමෙන් ගැටලු ඇතිවන බව.

**d. කාරක සභාවේ නිර්දේශ**

බොරැල්ල සුසාන භූමිය තුළ ස්මාරක ඉදිකිරීම සඳහා බිම් කොටස් පවරාදීමේදී නිකුත් කරන ලද ඔප්පු පිළිබඳ දැනට පවතින තොරතුරු ඇතුළත් වාර්තාවක් සතියක් තුළ (2025.03.04 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නිර්දේශ කළ අතර ප්‍ර.ග.නි./ ග.නි. ඒ සඳහා එකඟ විය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

ඔප්පු නිකුත් කිරීමේදී සටහන් කරනු ලබන රෙජිස්ටරවල ඇතුළත් තොරතුරු පිළිබඳව වාර්තාවක් කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025 හා 2025.03.15 දිනැති ලිපියෙන් ඉදිරිපත් කර ඇත.

එම වාර්තාවට අනුව,

- කිසිදු තොරතුරක් සොයාගත නොහැකි රෙජිස්ටර් පොත් අංක 07හි ඇතුළත් වී ඇතැයි සැලකෙන ඔප්පු 959ක් සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමට කටයුතු කරන බව,
- එම ඔප්පු අංක හිමි අය වෙතොත් එහි පිටපතක් සුසාන භූමි පාලක වෙත ලබාදෙන ලෙස දැන්වීමක් බොරැල්ල පොදු සුසාන භූමියේ ප්‍රදර්ශනය කර ඇති අතර ප්‍රසිද්ධ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයන්වල ද පළ කිරීමට කටයුතු කරන බව,

සඳහන් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.10.08</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

බොරැල්ල සුසාන භූමියේ බදු දී ඇති ස්ථාන පිළිබඳ සිතියම් හා ලේඛන පවත්වාගෙන යාම.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

- මේ වන විට බොරැල්ල සුසාන භූමියේ සිතියම් හඳුනාගැනීම හා ඒ සම්බන්ධව දත්ත පද්ධතියක් ස්ථාපනය කර ඊට තොරතුරු ඇතුළත් කිරීමේ කටයුතු 90% ක් පමණ අවසන් කර ඇති බව,
- සිතියම් පරීක්ෂා කර ඔප්පු අංකනය කිරීම හා ඉඩම් කොටස් භෞතිකව අංකනය කිරීම සිදු කෙරෙමින් පවතින බව,

ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළාය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

බොරැල්ල සුසාන භූමි ප්‍රමාණය කළමනාකරණයට මනා වැඩපිළිවෙලක් තිබිය යුතු බව.

**d. කාරක සභාවේ නිර්දේශ**

යෝජිත විසඳුම, එයට අදාළ වැඩපිළිවෙල ද සමඟ වන ප්‍රගතිය මාස 1 ½ ක් තුළ (2025.11.22 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කාරක සභාව නිර්දේශ කළ අතර ග.නි. ඒ සඳහා එකඟ විය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025/02 හා 2025.11.17 දිනැති ලිපියෙන් පහත කරුණු වාර්තා කර ඇත:

- බොරැල්ල සුසාන භූමියේ සම්පූර්ණ භූමි ප්‍රමාණයෙන් 40% කට ආසන්න ප්‍රමාණයක් පමණක් කොළඹ මහා නගර සභාවෙන් පාලනය කරනු ලබන අතර, වෙනත් ආගමික ප්‍රජාවන් වෙත වෙන් කර ඇති සෙසු බිම් ප්‍රමාණය තුළ ස්මාරක සකස් කිරීම හෝ භූමදාන සඳහා කොටස් වෙන්කර දීම සම්බන්ධව කිසිදු මැදිහත්වීමක් කොළඹ මහා නගර සභාව විසින් සිදු නොකරන බව.
- පවතින සහ සොයාගන්නා ලද තොරතුරු ආශ්‍රයෙන් මේ වන විට පරිගණකගත කර ඇති දත්ත අනුසාරයෙන් සිතියම් යළි සම්පූර්ණ කිරීම සිදු කෙරෙමින් පවතින බව.
- සුසාන භූමිය තුළ මේ වන විට ඉතිරිව පවතින ඉඩකඩ ප්‍රමාණය සීමිත බැවින් අඩි 2x2 ප්‍රමාණයේ බිම් කොටස් ලබා දීමේ පහසුකම සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇති බව.
- ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පවතින නීති රාමුව විධිමත් කර ගැනීම සඳහා කටයුතු කිරීමට යෝජිත බව.
- සුසාන භූමියට අදාළ දත්ත පද්ධතිය සහ සිතියම් පද්ධතිය යළි සකස් කිරීමේ කටයුතු මාස 06ක කාලයක් තුළ අවසන් කිරීමට අපේක්ෂිත බව.
- සුසාන භූමි කටයුතු අධීක්ෂණය කරමින් නිවැරදිව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරියෙකු මේ වන විට පත්කර ඇති බව.

## 06. අපජල පොම්පාගාරය සහ අපජල පවිත්‍රාගාරය

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.02.25

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

- කොම්පඤ්ඤ වීදියේ අපජල පොම්පාගාරයේ වර්තමාන තත්ත්වය
- ඉදිකිරීම් අත්හැර දැමුණු අපජල පවිත්‍රාගාරයේ වර්තමාන තත්ත්වය

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

- කොම්පඤ්ඤ වීදියේ අපජල පොම්පාගාරයේ අපජලය බේරේ වැවට මුදා නොහැර ගැඹුරු මුහුදට මුදාහරින බව,
- වසර සියයකට වඩා පැරණි කොළඹ නගරයේ මලාපවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ අපජල පවිත්‍රාගාරයක් ඉදි කිරීමට සැලසුම් කළ අතර, වැල්ලවත්ත ප්‍රදේශයේ පිහිටි කොළඹ මහා නගර සභාවට අයත් ක්‍රීඩාංගණයක් ඒ සඳහා වඩාත් සුදුසු භූමිය ලෙස හඳුනාගත් බව,
- කෙසේ නමුත්, ඒ සම්බන්ධයෙන් ඇතිවූ දැඩි ජනතා විරෝධය හේතුවෙන් එම ක්‍රීඩාංගණය සඳහා විකල්ප භූමියක් ලෙස ඊට යාබද ඉඩම තුළ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් භූමියක් ඒ සඳහා ලබාදීමට එකඟ වුවද එය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ව්‍යාපෘතිය අතරමඟ නතර කිරීමට සිදු වූ බව සහ ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වෙත එතෙක් ඔහු විසින් කරන ලද වියදම් සඳහා ගෙවීම් කිරීමට සිදු වූ බව,

ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

- කොම්පඤ්ඤ වීදියේ අපජල පොම්පාගාරයේ අපජලය පිරිපහදු කිරීමෙන් තොරව ගැඹුරු මුහුදට මුදාහැරීම හේතුවෙන් ඉදිරියේදී පරිසර ගැටලු ඇතිවිය හැකි බව කාරක සභාව නිරීක්ෂණය කළේය.
- උද්ගත විය හැකි ගැටලු නිවැරදි ශක්‍යතා වාර්තාවක් මගින් නිසි පරිදි පුරෝකථනය කිරීමකින් තොරව වැල්ලවත්ත අපජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වීම හේතුවෙන් අදාළ කොන්ත්‍රාත්කරු වෙත සැලසුම් සකස් කිරීම් සඳහා වැය වූ රුපියල් මිලියන 619ක වන්දි මුදලක් ගෙවීමට සිදුව තිබීමත් අදාළ ආයතන මේ සම්බන්ධව වගකීම් විරහිතව ක්‍රියා කිරීම පිළිබඳවත් කාරක සභාව සිය අප්‍රසාදය පළ කළේය.

**d. කාරක සභාවේ නිර්දේශ**

1. අපජලය පිරිපහදු කිරීමෙන් තොරව ගැඹුරු මුහුදට මුදාහැරීම නතරකොට සුදුසු සැලසුම් සකස් කළ යුතු බව
2. පළාත් පාලන මැතිවරණයෙන් පසුව මහා සභාව නැවත තෝරා පත් කරගත් පසුව වැල්ලවත්ත අපජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සොයා බැලිය යුතු බවට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

ප්‍රගතිය විමසීමට කාරක සභා නිර්දේශ ලබා දී නැත.

## 07. රථවාහන නැවතුම්පළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් කුලී මුදල් අය කර ගැනීමේ දුර්වලතා පැවතීම

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.02.27

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

- රථවාහන නැවතුම්පළ කුලී කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.590,571,051ක හිඟ රථ වාහන නවතා තැබීමේ කුලී අයවීමට තිබීම.
- හිඟ රථවාහන නවතා තැබීමේ කුලී මුදල් ගෙවීමට ඇති ඇතැම් රථවාහන නවතා තැබීමේ කොන්ත්‍රාත්කරුවන් වෙත නැවත නැවතත් කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබීම.
- කොළඹ මහ නගර සභාවේ මන්ත්‍රීවරුන්ගේ කාර්යාලවලට රථවාහන නවතා තැබීම සඳහා මහා නගර සභාව විසින් ලබා දී තිබූ ස්ථාන ඇතැම් මන්ත්‍රීවරු විසින් ව්‍යාපාරික ආයතන වෙත විකුණා පෞද්ගලිකව විශාල වශයෙන් ආදායම් උපයාගෙන ඇති බවට විගණකාධිපතිවරයාගේ චෝහාරික විගණන වාර්තාවක් මඟින් පෙන්වා දී තිබීම.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**

- කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම කොන්ත්‍රාත්කරුවන් විසින් කුලී මුදල් සංශෝධනය කරන ලෙසට ඉල්ලීම් කරන ලද අතර එම සංශෝධන කටයුතු ප්‍රමාද වීම මත සහ

ඇතැම් සහා තීරණ මත හිඟ මුදල් පවතින ආයතන වෙත පසුගිය කාලවකවානුව තුළ නැවත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම් සිදු කර ඇති බව,

- 2025 වර්ෂය සඳහා රථවාහන නවතා තැබීමේ කොන්ත්‍රාත් ලබා දීමේදී හිඟ ගෙවීම් පවතින ටෙන්ඩර්කරුවන්ට ඒ සඳහා ඉදිරිපත් විය නොහැකි බවට ප්‍රසම්පාදන කොන්දේසියක් පැනවූ බව සහ පවතින සියලු හිඟයන් අය කර ගැනීමට අදාළ නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව,

ප්‍ර.ග.නි./ ග.නි., ප්‍රකාශ කළේය.

- කොළඹ නගර සභාවේ මන්ත්‍රීවරුන් වැඩි ප්‍රමාණයක් තම කාර්යාල සඳහා වාහන නවතා තැබීමේ ස්ථාන කොළඹ 11 මල්වත්ත පාරෙන් වෙන් කරවා ගෙන තිබූ නමුත් ඔවුන්ගේ කාර්යාල එම ස්ථාන ආසන්නයේ නොතිබූ බවට විගණකාධිපතිවරයාගේ වෝහාරික විගණන වාර්තාවක් මඟින් අනාවරණය කර ගෙන ඇති බව හිටපු නාගරික කොමසාරිස් ප්‍රකාශ කළාය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

කාර්යාල සඳහා ලබා දුන් බිම් කොටස් ආර්ථික කටයුතු සඳහා යෙදවීම රජයේ දේපළ දැඩි ලෙස අවභාවිතා කිරීමක් බවත්, අදාළ මන්ත්‍රීවරුන්ගෙන් ඒ සඳහා අධිභාර අයකර ගත යුතු වන බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය.

### d. කාරක සභාවේ නිර්දේශ

මෙම කරුණ සම්බන්ධයෙන් අදාළ තොරතුරු විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර, කාර්යාල සඳහා ලබා දුන් බිම් කොටස් ආර්ථික කටයුතු සඳහා යෙදවීම සිදු කරන ලද බවට හෙළි වන මන්ත්‍රීවරුන්ගෙන් ඒ සඳහා අධිභාර අයකර ගැනීමට කටයුතු කරන ලෙසට කාරක සභාව නිර්දේශ කළ අතර ප්‍ර.ග.නි./ ග.නි. ඒ සඳහා එකඟ විය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අධිභාර නිවේදන නිකුත් කිරීමේ කටයුතු විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන බව කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025 හා 2025.03.15 දිනැති ලිපියෙන් වාර්තා කර ඇත

## 08. බස් නැවතුම් දැන්වීම් පුවරු ව්‍යාපෘතිය, ග්‍රැන්ට් සංඥා පුවරු සහ Smart Street Light යන ව්‍යාපෘති සම්බන්ධ ගැටලු

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.02.27

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

- මෙම ව්‍යාපෘති 03ම එකම පුද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර ඇති බැවින් එම සමාගම තෝරාගන්නා ලද ක්‍රමවේදය.
- Smart Street Light ව්‍යාපෘතිය තුළින් අධි ආරක්ෂක කලාප පවා ආවරණය වන පරිදි CCTV කැමරා සවිකිරීමට අවස්ථාව සලසාදීම සහ එමඟින් එක්රැස් කරනු ලබන දත්තවලට ප්‍රවේශ පහසුකම් පෞද්ගලික ආයතනයක් සතුවීම හේතුවෙන් ජාතික ආරක්ෂාවට බලපෑමක් සිදුව තිබෙන බවට වාර්තා වීම.
- ලංසු කැඳවීමේ දැන්වීමේ මෙම ව්‍යාපෘතිය කොළඹ මහා නගර සභාවට වියදම් රහිත ව්‍යාපෘතියක් ලෙස සඳහන් කර තිබුණ ද, පසුව වීදි පහන් කණුවල නඩත්තු වියදම් කොටස මහා නගර සභාව විසින් දැරීමට එකඟ වී ඇති බව අනාවරණය වීම.
- 2010 වර්ෂයේදී ආරම්භ කළ ග්‍රැන්ට් සංඥා පුවරු ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී නැවත ලංසු කැඳවීමකින් තොරව එකම ආයතනය වෙතම තවත් වසර 03කට ලබා දී තිබීම.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

- රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්ව (PPP) අනුග්‍රාහක ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක කර ඇති මෙම ව්‍යාපෘති සඳහා අවස්ථා තුනකදී වෙන වෙනම ටෙන්ඩර් කැඳවීම් සිදු කර මෙම කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති බව,
- එකම සමාගමකට අයත්, එකම අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත, එහෙත් එකිනෙකට වෙනස් ආයතන 03කට මෙම කොන්ත්‍රාත් 03 ලබා දී ඇති බව,
- කොළඹ නගරයේ වීදි ලාම්පු 12,000ක් සුහුරු ලාම්පු බවට හරවා ප්‍රධාන පාලක මධ්‍යස්ථානයක් හරහා එම පද්ධතිය පාලනය කිරීමේ අරමුණින් ආරම්භ කළ Smart Street Light ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවීමේදී ව්‍යාපෘතිය සඳහා අමතර විකල්ප යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ලංසුකරුවන් වෙත අවස්ථාව ලබා දී තිබූ බව සහ මහා නගර සභාවට අමතර වියදමකින් තොරව වීදි පහන් කණුවල CCTV කැමරා 200ක් සවි කිරීමට ප්‍රශ්නගත ආයතනය විසින් ඉදිරිපත් කළ යෝජනාව අනුව එම ආයතනය වෙත ව්‍යාපෘතිය ලබා දුන් බව,

- කොළඹ මහා නගර සභාව සතු පාලන මධ්‍යස්ථානයක ගබඩා වන, මෙම CCTV කැමරා මඟින් ලබා ගන්නා දත්තවල අයිතිය මහා නගර සභාව සතු වන බව සහ සකසන ලද දත්ත (processed data) පමණක් වාණිජමය අරමුණු සඳහා මෙම ආයතනය වෙත ලබා දෙන බව,
- ආරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් පවතින නීතිමය ප්‍රතිපාදනවලට යටත් වන පරිදි මෙම ගිවිසුම අත්සන් කර ඇති බව,
- 2015 වර්ෂයේදී නිවාස සහ ගොඩනැගිලි වරිපනම් අංක පුවරු සවි කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ලංසු කැඳවීමේදී නව කොන්දේසි කිහිපයක් සහිතව ග්‍රැන්ටි සංඥා පුවරු ව්‍යාපෘතියේ දිගුවක් ලබා දීම යන කොන්දේසිය යටතේ එම ව්‍යාපෘතිය නොමිලේ සිදු කිරීම සඳහා ප්‍රශ්නගත සමාගම විසින් ඉදිරිපත් කළ විකල්ප යෝජනාවක් අනුව ග්‍රැන්ටි සංඥා පුවරු ව්‍යාපෘතිය නැවත ප්‍රදානය කිරීම සිදු කර ඇති බව,

ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.

- ප්‍රශ්නගත ව්‍යාපෘතියෙන් කොළඹ මහා නගර සභාවට රුපියල් බිලියන 2.45ක පාඩුවක් සිදුවන බවට හිටපු නාගරික භාණ්ඩාගාරික විසින් වාර්තා කර තිබුණු බව සහ මෙම ගිවිසුමේ ඇතැම් කොන්දේසි පවතින නීති ප්‍රතිපාදනවලට පටහැනි බව නිරීක්ෂණය කළ බැවින් ගිවිසුම සංශෝධනය විය යුතු බවට තමා විසින් එවකට පැවති සභාව දැනුවත් කළ බව,
- ප්‍රශ්නගත සමාගමේ නිලධාරියකු විසින් තමා වෙත තර්ජනය කිරීම සහ මෙම ව්‍යාපෘතියට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය පිහිටි ප්‍රදේශයේ වීදි පහන්වල පාලනය එවකට එම සමාගම සතුව පැවති බවට තහවුරු වී තිබීම මත ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලුවක් උද්ගත වන බැවින් ඒ සම්බන්ධව පොලිස්පතිවරයා දැනුවත් කළ බව,
- පැවති නීති ප්‍රතිපාදන හා තම විරෝධය නොතකා ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපස එල්.ඊ.ඩී. වෙළඳ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම සමාගම විසින් කැනීම් කටයුතු කිරීමට උත්සාහ දරා තිබූ අතර පසුව පොලීසිය මැදිහත්ව එය නතර කළ බව,
- පසුව මෙම ව්‍යාපෘතියේ කටයුතු සඳහා බාධා කරන බවට චෝදනා කරමින් අදාළ සමාගම විසින් තමාට එරෙහිව පෞද්ගලික වනසේ නඩුවක් පැවරීමට ක්‍රියා කර තිබූ බව,
- සභාවේ විධිමත් අනුමැතියකින් තොරව, ව්‍යාජ අත්සනක් යෙදූ ඊ-මේල් පණිවිඩයක් මඟින් මෙම පුද්ගලික සමාගම වෙත රුපියල් බිලියන ගණනක් වටිනා ව්‍යාපාරයක් සඳහා අනුමැතියක් ලබා දී ඇති බව තමා විසින් රහසිගතව සිදුකරන ලද විමර්ශනයකින් අනාවරණය කර ගත් බව,

- මෙම ව්‍යාපෘතිය සම්බන්ධව මූල්‍ය විමර්ශන සිදු කිරීම සඳහා විශාල සහයක් ලබා දුන් වර්තමාන නාගරික භාණ්ඩාගාරික නිලධාරිනිය වෙත මේ වන විට ස්ථාන මාරුවක් ලබා දී ඇති බැවින් ඇය සතුව පවතින මූල්‍ය වංචාවලට අදාළ වැදගත් තොරතුරු සහිත ලේඛන සුරක්ෂිත කිරීමට පියවරක් ගන්නා මෙන් ඉල්ලා සිටින බව,

හිටපු නාගරික කොමසාරිස්වරිය පැහැදිලි කළාය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

- Smart Street Light ව්‍යාපෘතිය ප්‍රදානය කර ඇති ආයතනය එම කාර්යය සඳහාම අලුතෙන් ඇති කර ඇති ආයතනයක් බැවින් ලංසු ඇගැයීමේදී සමාගම් සමූහයේ (group of companies) පළපුරුද්ද ලංසු ඇගැයීමේදි එම ආයතනයට ද අදාල කර ගෙන තිබීම නිවැරදි නොවන බව,
- ග්‍රැන්ට් සංඥා පුවරු ව්‍යාපෘතිය යටතේ ගිවිසුම්ගත කටයුතු නිම වී නොතිබුණු අතරතුර සම්පූර්ණයෙන්ම වෙනස් විෂය පථයක් යටතේ ගැනෙන වෙනත් ව්‍යාපෘතියක කටයුතු වලට සම්බන්ධව නැවත එහි කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනි බව සහ අනෙකුත් තරගකාරී ඉල්ලුම්කරුවන් වෙත සාධාරණ අවස්ථාවක් අහිමි කිරීමක් වන බව,

කාරක සභාව නිරීක්ෂණය කළේය.

### d. කාරක සභාවේ නිර්දේශ

1. කාරක සභාවේදී අනාවරණය වූ ව්‍යාජ අත්සන් යෙදූ ඊ-මේල් පණිවිඩයක් මගින් ව්‍යාපාර කටයුත්තක් සඳහා අනුමැතියක් ලබා දී තිබීම (කූඨ ලේඛන සකස් කිරීම) සහ වීදි ලාම්පුවල පාලනය බාහිර පාර්ශ්වයක් අත පැවතීම මත ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවීම යන කරුණු සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ කටයුතු 2025.02.28 දින සිදු කරන ලෙසත්,
2. නාගරික භාණ්ඩාගාරික ස්ථාන මාරු වී යාමේදී එම නිලධාරිනිය සතුව පවතින මූල්‍ය වංචාවලට අදාළ තොරතුරු ඇතුළත් ලේඛන සියල්ල ලිඛිතව හා ආරක්ෂිතව සුදුසු නිලධාරියකු වෙත භාර දෙන ලෙසත්,
3. මෙම ගැටලුව සම්බන්ධව විගණන වාර්තා ලුහුඬු සටහනෙහි සඳහන් කරුණු පිළිබඳව වර්තමාන තත්ත්වය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කරන ලෙසත්,

කාරක සභාව නිර්දේශ කළ අතර නාගරික කොමසාරිස් ඒ සඳහා එකඟ විය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

1. 2025.03.06 හා 07 දිනැතිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි ඉදිරිපත් කර ඇති බව කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025 හා 2025.03.15 දිනැති ලිපියෙන් වාර්තා කර ඇත.
2. කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක SEC/SC12(RD 09)/PF-Per.App.-MT හා 2025.05.14 දිනැති ලිපියෙන් 2025.05.16 දින ස්ථාන මාරු වී යන නාගරික භාණ්ඩාගාරික සතුව පවතින මූල්‍ය වංචාවලට අදාළ තොරතුරු ඇතුළත් ලේඛන සියල්ල ලිඛිතව හා ආරක්ෂිතව ප්‍රධාන ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙත භාරදෙන ලෙස දන්වා ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.10.08</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

2025 පෙබරවාරි 27 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් මේ සම්බන්ධයෙන් ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**

- 2025.02.27 දිනයන්හිදී පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම කරුණු සම්බන්ධයෙන් ලබාදුන් නිර්දේශය පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලද බව සහ එම විමර්ශන කටයුතු සඳහා කරුණු පැහැදිලි කිරීමට යොමු කළ නිලධාරීන් විසින් ඒ සම්බන්ධව තාක්ෂණික අවබෝධයක් නොමැති බව ප්‍රකාශ කිරීම හේතුවෙන් ඒ බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා යැවූ බව,
- පසුගිය කාරක සභා රැස්වීමේදී සාකච්ඡා වූ කරුණු අනුව ඇති වූ තත්ත්වය මත Smart Street Light ව්‍යාපෘතිය සඳහා ප්‍රශ්නගත සමාගම විසින් ඉදිරිපත් කර ඇති යෝජනාවේ මූල්‍යමය ශක්‍යතාවය පිළිබඳ ඇගයීම සඳහා කමිටුවක් පත් කරන ලද බව සහ එම කමිටුවේ තීරණය මත ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක වීම තීරණය වන බව,

ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළාය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

විමර්ශන කටයුතු සාර්ථක කරගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනුවත්භාවයක් සහිත, නිවැරදි තොරතුරු ලබා දිය හැකි නිලධාරීන් විමර්ශනය සමඟ සම්බන්ධ කිරීමේ වැදගත්කම කාරක සභාව නිරීක්ෂණය කළේය.

**d. කාරක සභාවේ නිර්දේශ**

2025.02.27 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලද, එදින සාකච්ඡා කරන ලද විගණන වාර්තා කෙටුම්පතේ මෙම ගැටලුව සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව වර්තමාන තත්ත්වය ඇතුළත් වාර්තාව සහ Smart Street Light ව්‍යාපෘතිය සම්බන්ධ නව ව්‍යාපෘති යෝජනාවේ මූල්‍යමය ශක්‍යතාවය පිළිබඳ ඇගයීම සඳහා පත්කර ඇති කමිටුවේ වාර්තාව, මාසයක් තුළ (2025.11.08 දිනට පෙර) කාරක සභාව වෙත යොමුකිරීමට කාරක සභාව කළ නිර්දේශයට ග.නි. එකඟ විය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

2025.02.27 දින සාකච්ඡාවට පාදක වූ අංක SIF/A/AG/ABFD/2022/04 හා 2022.04.22 දිනැති චෝහාරික විගණන වාර්තාවට අදාළව වර්තමාන තත්ත්වය කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/COPA/2025/02 හා 2025.11.06 දිනැති ලිපියෙන් වාර්තා කර ඇති අතර, ප්‍රශ්නගත සමාගම විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති සංශෝධිත නව යෝජනාවේ මූල්‍යමය ශක්‍යතාවය පිළිබඳ ඇගයීම සඳහා පත්කරන ලද කමිටුව විසින් එම යෝජනාව කොළඹ මහා නගර සභාවට මූල්‍යමය වශයෙන් අවාසිදායක බව නිර්දේශ කර ඇති බැවින් ඉදිරි තීරණ ගැනීම සඳහා නගරාධිපතිතුමිය මඟින් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. අදාළ කමිටු වාර්තාවේ පිටපතක් ද කාරක සභාව වෙත යොමු කර ඇත.

## 09. කාර්ය මණ්ඩල පුරප්පාඩු

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.10.08</u>

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

- කොළඹ මහා නගර සභාවේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 2025.06.30 දිනට තනතුරු 3744ක් පුරප්පාඩුව පැවතීම සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 11 දෙනෙකු ශ්‍රම මිලදී ගැනීමේ පදනම යටතේ සේවය කරන බවට වාර්තා වීම.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

- ශ්‍රම මිලදී ගැනීම යටතේ ප්‍රධාන වශයෙන් මලාපවහන හා ඝන අපද්‍රව්‍ය අංශවල සේවකයින් බඳවා ගනු ලබන බව,
- පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයක් අනුව සේවක හිඟය මඟහරවා ගැනීම සඳහා මේ අවස්ථාවේදී ශ්‍රම මිලදී ගැනීමේ පදනම යටතේ විවිධ මට්ටම්වල සේවකයින් සේවයේ යොදවා ගැනීම සිදු කර ඇති බව,
- විධිමත් ලෙස බඳවා ගැනීම් සිදු කිරීම සඳහා අවශ්‍ය වාර්තා බස්නාහිර පළාත් සභාවේ නිර්දේශ සහිතව අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවේ අනුමැතියට යොමු කර ඇති බව,
- මේ වන විට ශ්‍රම මිලදී ගැනීමේ පදනම යටතේ ශ්‍රමිකයින් පමණක් බඳවා ගනු ලබන බව,
- තාක්ෂණ නිලධාරීන්ගේ සේවය ගිවිසුම් යටතේ ලබාගන්නා ලෙසට පරිවර්තනය කර ඇති බව,

ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.

- මේ වන විට අනුමැතියට යොමුකර ඇත්තේ කොළඹ මහා නගර සභාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා බව බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් ප්‍රකාශ කළේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

උක්ත කරුණු අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත බඳවා ගැනීම සඳහා කිසිදු ප්‍රතිපාදනයක් නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළේය.

### d. කාරක සභාවේ නිර්දේශ

ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත බඳවා ගැනීම් සිදු කර ඇත්නම්, ඊට අදාළ කාල වකවානු, බඳවා ගත් ආකාරය හා ඒ සඳහා අනුමැතිය ලබාගත් ආකාරය පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කිරීමට කාරක සභාව කළ නිර්දේශයට ග.නි. එකඟ විය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

මෙතෙක් කාරක සභාව වෙත වාර්තා කර නොමැත.